මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
දිනය 2023 මැයි 17

**2023 මැයි 17 දින පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය**

| කල්පිරීම (දින) | ඉදිරිපත් කළ ප්‍රමාණය | ලැබුණු ලංසු ප්‍රමාණය | පිළිගත් ලංසු ප්‍රමාණය(අ) | බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) | |
|---|---|---|---|---|---|
| | | | | මෙම වෙන්දේසිය | පසුගිය වෙන්දේසිය |
| **91** LKA09123H186 | 90,000 | 121,022 | 79,862 | **25.47** | 25.80 |
| **182** LKA18223K179 | 45,000 | 65,377 | 47,492 | **25.22** | 25.42 |
| **364** LKA36424E174 | 45,000 | 74,952 | 52,646 | **22.79** | 23.14 |
| **එකතුව** | **180,000** | **261,351** | **180,000** | | |

*සියලුම වටිනාකම් රු. මිලියන වලින් වේ.*

**(අ) ගෙවීම් කළ යුතු දිනය: 2023 මැයි 19**

**ඉහත වෙන්දේසියේදී තීරණය වූ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික යටතේ සු.හ.ජා. අංක LKA09123H186, LKA18223K179 සහ LKA36424E174 සඳහා අදියර II හරහා ලංසු ඉදිරිපත් කිරීම වෙන්දේසියේ ගෙවීම් කළ යුතු දිනයට පෙර ව්‍යාපාරික දිනයේ (එනම්, 2023.05.18) ප.ව. 3.30 දක්වා විවෘතව පවතී.** අදියර II හිදී, ඉහත සු.හ.ජා. අංක යටතේ ඉදිරිපත් කරනු ලබන සමස්ත මුදල වනුයේ, වෙන්දේසියේ දී පිරිනමන ලද සමස්ත මුදලින් 25%කි.

අදියර II සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රමාණය අභිබවා ලංසු ලැබුනහොත්, වෙන්දේසියට සහභාගී වූ පාර්ශ්වයන්ගේ සමස්ත සාර්ථකත්වයට සමානුපාතිකව වෙන් කිරීම් සිදු කරනු ඇත.

අදියර II සඳහා ඉදිරිපත් කරන ඕනෑම ලංසුවක්, බලයලත් ප්‍රාථමික අලෙවිකරුවෙකු හරහා නියමිත කාලසීමාව තුළ **fopdd@cbsl.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය. ප්‍රාථමික වෙන්දේසියේදී ලංසුවක් සඳහා අවශ්‍ය වන අවම මුදල, අදියර II සඳහා ද අදාළ වේ.